# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2014-03-27

**වේලාව** : පෙ.ව. 10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 3. | නගර සභා ගරු මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 4. | නගර සභා ගරු මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 6. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | නගර සභා ගරු මන්ත්‍රී | අසංක ජයමිණි විජයසිංහ මැතිතුමා |
| 8. | නගර සභා ගරු මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 9. | නගර සභා ගරු මන්ත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

වසර කිහිපයක් තිස්සේ මෙම සභාව විසින් ඉල්ලීම් කළ පරිදි, සෞඛ්‍ය කම්කරුවන් 15 දෙනෙකු හට ස්ථිර පත්වීම් ලබා ගැනීමට හැකියාව ලැබුණු බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

2014 වර්ෂයේ අයවැයෙන් ග්‍රාමීය සංවර්ධනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් අතිගරු ජනාධිපතිතුමන් විසින් වෙන් කරන ලද බව ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනසභා පවත්වමින් සියලු සංවර්ධන කාර්යයන් සඳහා යෝජනා ලබා ගැනීම් සිදුකරන බව ද, පළාත් පාලන ආයතන සඳහා ද මෙවර අයවැයෙන් මුදල් ප්‍රමාණයක් වෙන්ව ඇති බව ද ගරු සභාපතිතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

මෙවර අලුත් අවුරුදු උත්සවය අප්‍රේල් මස 18 වන දින නගර සභා ක්‍රීඩා පිටියේ දී මෙම සභාව සමඟ බළන්ගොඩ පොලිසිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ සියලුම රාජ්‍ය ආයතන සහ

ව්‍යාපාරික ප්‍රජාව එක්ව පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව ද, මේ සඳහා සිටි එෆ් එම් ආයතනය, දිනමිණ, සිළුමිණ, සරසවිය සහ තරුණී පුවත්පත් මාධ්‍ය අනුග්‍රහය ලබා දෙන බව ද, ජාතික රූපවාහිනියෙන් එය විකාශය වන බව ද ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. අප්‍රේල් මස පළමු සතියේ සිට ජාතික ගුවන් විදුලිය මගින් මෙම ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් වැඩසටහන් ප්‍රචාරය කිරීමට සැලසුම් කර ඇති බව ද, මෙම අවුරුදු උත්සවය සංවිධානය කිරීම සඳහා පැවති රැස්වීම් වලට නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙකු පමණක් පැමිණි බව ද, ඉදිරි රැස්වීම් සඳහා අනෙකුත් නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ පැමිණීම හා සහයෝගයබලාපොරොත්තු වන බව ද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

වෙට්නෝල් පාර සුදර්ශන ගම මාර්ගයන් අලුත්වැඩියා කරදෙන මෙන් 2014.02.24 කර්මාන්ත කමිටුවේ දී ඉල්ලීමක් තමන් විසින් සිදු කරන ලද බවත් මෙතෙක් ඒ සම්බන්ධව පියවරක් නොමැති බව ගරු උප සභාපතිතුමන් සඳහන් කරන ලදී.

මෙදින වෙට්නෝල් පාර සංවර්ධනය සිදු කෙරෙමින් පවතින බවත්, සභාව සතු කම්කරුවන් ප්‍රමාණය  අනුව සංවර්ධන කටයුතු සිදු කිරීමේ දී යම් කාලයක් ගතවන බවත්, මේ වන විට සරස්වතීපාර සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර  ඇති බවත්, ඉදිරියේ දී ප්‍රමුඛතා ලැයිස්තුවේ මීළඟට ඇති වෙට්නෝල් පාර සහ සුදර්ශන ගම යන මාර්ගයන් ද සංවර්ධනය කිරීම සිදුවන බවත් ගරු සභාපතිතුමන් එයට පිළිතුරු ලබා දෙමින් ප්‍රකාශ කරන ලදී.

පසුගිය මහා සභා වාර්තාවේ 06:04 යටතේ ''නිම්නද රේඩියෝ'' ආයතනය පවත්වාගෙන ගිය කඩකාමරය පුබුදු සම්පත් යන අයට ලබා දීමට තීරණය කර ඇති බව දක්වා තිබුණ ද, මහා සභාවේ දී එම අය සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නොකළ  බව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

එම අය විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිය අනුව එය සාකච්ඡාවට ගන්නා ලද බව එයට පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 තුඹගොඩ වරිපනම් අංක 111 දරන ව්‍යාපාරික ස්ථානය පිළිබඳවයි - බළන්ගොඩ පියනන්ද හිමි

තුඹගොඩ අංක 111 ස්ථානයේ පිහිටි ව්‍යාපාරික ස්ථානයට අදාලව නඩු දෙකක් බළන්ගොඩ අධිකරණයේ විභාග වෙමින් පවතින අතර, ඒ හේතුවෙන් එම ස්ථානය වසර දෙකක පමණ කාලයක් තිස්සේ වසා ඇති බැවින් වරිපනම් සහනයක් ලබා දෙන ලෙස තුඹගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාරාධිපති පූජ්‍ය බළන්ගොඩ පියනන්ද හිමියන් විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, 2014 වර්ෂය සඳහා අදාල ස්ථානය පරිපනම් අය කිරීමෙන් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි  විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:02 වරිපනම් සහනයක් ලබා ගැනීම - එච්. කේ. නන්දනී අල්විස් මිය, අංක 14/3, පරණ පාර**

තමන් හට අයත් ඔප්පු අංක 16806 දරන කඩයේ උඩුමහල ප්‍රයෝජනයකට නොගෙන වසා දමා ඇති බැවින් ඒ සඳහා වරිපනම් සහනයක් ලබා දෙන මෙන් එච්. කේ. නන්දනී ය නඅය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් සඳහන් කරන ලද අතර, 2014 වර්ෂය සඳහා එම ස්ථානයට අදාල වරිපනම් මුදලෙන් 50%ක් පමණක් අය කිරීමට යෝජනා කරන ලදී.
එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.
ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 වරිපනම් සහනයක් ලබා ගැනීම - අයිරාංගනී ලීලා ද සිල්වා, අංක 10/10, සමගි මාවත**

සමගි මාවත අංක 10/10 ස්ථානය දැනට අයිරාංගනී ලීලා ද සිල්වා යන අයගේ නමින් ගරාජයක් ලෙස ලියාපදිංචි කර ඇති බව ද, දැනට ගරාජය ඉවත් කර ඇති බැවින් සහ කිසිදු ව්‍යාපාර කටයුත්තකට යොදා නොගන්නා බැවින් එම හිස් ගොඩනැගිල්ලට 2014 වර්ෂය සඳහා 50%ක වරිපනම් සහනයක් ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2014**

2014 මග නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සඳහා කර්මාන්ත 10කට ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, මෙහි දී කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම අභ්‍යන්තර මාර්ගයන්හි සිදු නොකළ යුතු බව සහ කොන්ක්‍රීට් කුට්ටි 8600ක් ඇතිරිය යුතු බවටත් උපදෙස් ලැබී ඇති මුත් වෙන් වී ඇති කර්මාන්තයන්ගෙන් PCC/24/14/91, PCC/24/14/93, PCC/24/14/94, PCC/24/14/95, PCC/24/14/96, PCC/24/14/97, PCC/24/14/99, PCC/24/14/100, අංක දරන කර්මාන්තයන් අභ්‍යන්තර මාර්ග සහ අභ්‍යන්තර ස්ථාන වන බව ද, මේ අතරින් ඇතැම් කර්මාන්තයක වැඩ අවසන් කිරීමේ දී මාර්ගයේ දිග ප්‍රමාණවත් නොවීම සහ නිර්මිතයන් ඉදිකිරීම වැනි හේතූන් මත කුට්ටි 8600කට වඩා අඩුවෙන් ඇතිරීමට සිදුවන බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, කෙසේ වෙතත් එම වැඩසටහන යටතේ මෙම සභාවට ලැබී ඇති කර්මාන්ත සියල්ල සිදු කිරීම සඳහා මෙම සභාවේ අනුමැතිය ලබා දීමට සහ අදාල කර්මාන්තයන් සමිති හරහා සිදු කිරීමට ද යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 මහජන පුස්තකාල අතුරු ව්‍යවස්ථාව**

බලන්ගොඩ මහජන පුස්තකාලය සඳහා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා කෙටුම්පත ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර එය සභාවේ සම්මත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, ඒ සම්බන්ධව පහත සඳහන් අදහස් සහ සංශෝධන ඉදිරිපත් විය.

***නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා***

*නගරයේ පාසැල් වලට සිසුන් වැඩි දෙනෙකු පැමිණෙන්නේ නගර සීමාවෙන් පිටත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ වල සිටයි. මේ දරුවන්ට අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම නගර සභාවේ යුතුකමක්. පුස්තකාල උපදේශන කමිටුවේ දී ත් නගර සීමාවෙන් බැහැර පාඨකයන් සඳහා ද සාමාජිකත්වය ලබා දීමට තීරණයක් ගනු ලැබුවා.*

*පුස්තකාල කමිටුවේ සභාපති ධූරය සඳහා නගර සභා ගරු මන්ත්‍රීවරයකු ගරු සභාපතිතුමන් විසින් පත් කළ හැකි විය යුතුයි.*

***ගරු උප සභාපතිතුමා***

*පුස්තකාල කමිටුවට ගරු සභාපතිතුමන් සහ නගර සභා ගරු මන්ත්‍රීතුමන් ඇතුළත් වන ආකාරය දක්වා තිබුණත් උප සභාපතිවරයා ගැන එහි සඳහන් වන්නේ නෑ. එය ද ඇතුළත් විය යුතුයි.*

*සියලු ආගමික පූජ්‍ය/පූජක පක්ෂය සඳහා ඇපයක් සහිතව නොමිලයේ පුස්තකාල සාමාජිකත්වය ලබා දීම කළ යුතු බවට සංශෝධනයක් අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතුයි.*

*නගරය පවතින්නේ නගර සභා සීමාවේ ජීවත් වන අයගෙන් පමණක් නොවේ. බාහිර ප්‍රදේශ වල සිට පැමිණෙන විශාල ජනතාවක් සිටිනවා. ඔවුන්ගෙන් විශාල ආදායමක් ලැබෙනවා. එම අයට ද නගර සභාවේ සේවා ලබා ගැනීමට අවස්ථාව ලබා දීම කළ යුතුයි. ඒ සඳහා කොන්දේසි ඇතුළත් විය යුතුයි.*

***නගර සභා ගරු මන්ත්‍රී ඒ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා***

*නගරයට බොහෝ දෙනෙක් පිටතින් පැමිණෙනවා. පාසැල් සහ උපකාරක පන්ති වලට බොහෝ දරුවන් පැමිණෙනවා. ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා පුස්තකාලයේ අවස්ථාව ලබා දිය යුතුයි. නගර සභා සීමාව තුළ පදිංචි වරිපනම් ගෙවන අයකුගේ අත්සන සහිතව ඔවුන්ට සාමාජිකත්වය ලබා දිය යුතුයි.*

නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා වෙතින් ඉදිරිපත් වූ සංශෝධනයන් ද සහිතව මහජන පුස්තකාල අතුරු ව්‍යවස්ථාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 තානායමේ ඇති ලාංඡනය සහිත භාණ්ඩ පිළිබඳව තීරණයක් ගැනීම**

2013 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණයෙන් පාවිච්චියෙන් ඉවත් කළ නගර සභා ලාංඡනය සහිත තානායමේ භාණ්ඩ ඉවත් කිරීම ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 ජේ. සී. බී. යන්ත්‍රයේ මිල ගණන් සාකච්ඡා කිරීම**

2013 සිට මේ දක්වා ජේ සී බී යන්ත්‍රයේ ආදායම සහ වියදම පහත පරිදි ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| **ආදායම** | **රු.** | **810,000.00** |
| **වියදම** | | |
| අලුත්වැඩියාව සඳහා | රු. | 930,983.00 |
| රියදුරුට වැටුප් | රු. | 205,500.00 |
| ඉන්ධන සඳහා | රු. | 672,000.00 |
| | **රු.** | **1,808,483.00** |

ආදායමට වඩා වියදම වැඩි බැවින් සෙනොක් ආයතනය වෙත යවා සියලු කොටස් අලුත්වැඩියා කිරීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 185/6 දරන කඩකාමරය ලබා ගැනීම - ජයන්ත සේනාරත්න මයා**

බස් නැවතුම්පොල අංක 185/6 දරන කඩකාමරයේ බදුකරු වන එම්. ඉසෙඩ්. එම්. මුහුසුන් යන අය රැකියාවක් සඳහා විදේශගත වන බැවින් එම කඩකාමරය පවරා දෙන මෙන් ජයන්ත සේනාරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් මහා සභාවට දැනුම්දුන් අතර, අයවිය යුතු සියලු මුදල් අයකර බදු අයිතිය වෙනස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් පහත පරිදි අදහස් දක්වන ලදී.

> *නීත්‍යානුකූල පදනම මත බස් නැවතුම්පොලේ කඩ සම්බන්ධ කටයුතු නිවැරදියි. නමුත්, එම කඩ කාමර අත යටින් විශාල මුදලකට විකිණෙනවා. ලක්ෂ 20න් ඉහළ මුදලකට. බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම මාධ්‍යවේදීන් කළ යුතුයි. යම් අයුරකින් නාගරික සංවර්ධන අධිකාරියෙන් හෝ මෙම සභාවෙන් එම කඩ සම්බන්ධ තීරණයක් ගතහොත් එය ලබා ගන්නා තැනැත්තන් අමාරුවේ වැටෙනවා. ඔවුන්ට නීත්‍යානුකූල අයිතියක් හිමි වන්නේ නෑ. නමුත් සභාවේ ලියකියවිලි වල එය නීත්‍යානුකූල ලෙස සඳහන් වෙනවා.*

වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 ගබඩා පරිගණක වැඩසටහන සඳහා මුද්‍රිත ලේඛන වල ආසන්න මිල ගණන් ඇතුළත් කර ගැනීම**

ගබඩා පරිගණක වැඩසටහන සඳහා භාණ්ඩ විස්තර ඇතුළත් කිරීමේ දී ඒවායේ මිල ගණන් ඇතුළත් කිරීම අනිවාර්ය වුවත් ගබඩාවේ ඇති පැරණි මුද්‍රිත ලේඛනයන්හි මිල ගණන් සඳහන් නොවන බැවින් දළ මිල ගණන් ඒ සඳහා ඇතුළත් කිරීමට සකස් කරන ලද

ලැයිස්තුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 නිවාස ආධාරයක් ලබා ගැනීම - එම්. සගායා මේරි මිය**

තමන්ට සහ පවුලේ කිසිවකුට ස්ථිර රැකියාවක් නොමැති අතර තම නිවස දැඩි ලෙස අබලන් වී ඇති බැවින් එය සකස් කර ගැනීමට ආධාරයක් ලබා දෙන මෙන් එම්. සගායා මේරි යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ද, අදාල ස්ථානය කාර්මික නිලධාරී විසින් පරීක්ෂා කර ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම නිවස අලුත්වැඩියා කිරීම සඳහා සභා මුදලින් රු. 10,000.00 ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 තානායම් සේවකයන්ට වැටුපට අමතර දීමනාවක් ලබා ගැනීම**

පසුගිය 2014.02.21 වන දින පැවති තානායම් කාරක සභාවේ දී සම්මත වී ඇති පරිදි තානායමේ සේවකයන් හට මාසික වැටුපට අමතරව පහත පරිදි අමතර දීමනාවක් ගෙවීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

| | |
|---|---|
| කළමනාකරු | රු. 5,000.00 |
| ගබඩා භාරකරු | රු. 5,000.00 |
| ප්‍රධාන සූපවේදී | රු. 5,000.00 |
| සූපවේදී | රු. 2,500.00 |
| මුළුතැන්ගෙයි සහායක | රු. 1,500.00 |
| අනෙකුත් සේවකයන් | රු. 1,000.00 |

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:12 2014 පෙබරවාරි 8, 9, 10, 12, 13 දිනයන්හි වැසිකිළි වසා තැබීම - බී. ගුණරත්න මයා**

ජලය නොමැතිකමින් බස් නැවතුම්පොලේ ස්ත්‍රී සහ පුරුෂ වැසිකිළි 2014 පෙබරවාරි 8, 9, 10, 12, 13 දිනයන්හි වසා තිබූ බැවින් එම දිනයන්ට අදාල ගාස්තු නිදහස් කරන මෙන් බී. ගුණරත්න යන අය විසින් ඉල්ලීමක් කරන ලද බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ප්‍රකාශ කළ අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 බලන්ගොඩ නගර සභාව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර බේරුම්කරණ තීන්දුව සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම**

බලන්ගොඩ නගර සභාව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර බේරුම්කරණයේ තීන්දුව බල ගන්වන මෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල විසින් කොළඹ මහාධිකරණයට වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

මේ සම්බන්ධව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් පහත පරිදි අදහස් දක්වන ලදී.

*කාණු පද්ධතිය ඉදිකිරීමට වැය වන මුදලින් 80%ක් ආධාර වශයෙන් ලැබී තිබෙන්නේ. ඉතිරි 20% පමණයි ණය මුදලක් වශයෙන් ගෙවීමට ඇත්තේ. මෙම ණය මුදල ගෙවීමට ගිවිසුමෙන් මෙම සභාව බැඳී සිටිනවා. මෙයට අභියෝග කිරීමට අපට නොහැකියි. 2009 වර්ෂයේ සිට මේ සඳහා නීතිඥ ඩබ්. දයාරත්න මහතාට මෙම බේරුම්කරණය වෙනුවෙන් එක් වතාවකට රු. 30,000.00 බැගින් විශාල මුදල් ප්‍රමාණයක් ගෙවා තිබෙනවා. එම මුදල් වලින් ණය මුදලින් යම් ප්‍රමාණයක් ගෙවීමට ද තිබෙනවා. දයාරත්න මහතා දිනන ලද නඩුවක් ගැන මා අසා නෑ. මෙම නඩුවට ඩබ්. දයාරත්න මහතා පෙනී සිටීම සම්බන්ධයෙන් සභාවේ තීරණයක් ගෙන ඇති දැයි මා විමසනවා. මෙම ණය මුදල නොගෙවීම සම්බන්ධයෙන් ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුන් සමග සාකච්ඡා කළ බව සඳහන් වුවත් එයට විසඳුමක් ලැබී නෑ. මෙය නොගෙවුවහොත් ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවට වූ දෙයයි සිදුවන්නේ.*

***ගරු සභාපතිතුමා***

*මෙය අසාර්ථක ව්‍යාපෘතියක් නිසා මෙම සභාව විසින් භාර නොගත් බවත්, එබැවින් ණය මුදල ගෙවීමට නොහැකි බවත් අප බේරුම්කරණය හමුවේ කියා සිටියා. යම් නීති කාර්යයක් උද්ගත වූ විට ඒ සම්බන්ධයෙන් අප සුදුසු නීතිඥයන් යොදවා කටයුතු කළ යුතුයි. මෙහි දී සිදුකර තිබෙන්නේ එයයි. වෙනත් සුදුසු නීතිඥයකු දන්නවා නම් ඉදිරිපත් කරන්න.*

**06:14 ලොරිය සඳහා සභාවෙන් රු. 175,000.00ක් ගෙවීම**

පළාත් සභාව වෙතින් මෙම සභාවට ලැබුණු ලොරිය වෙනුවෙන් සතොස මෝටර්ස් පී එල් සී වෙත ගෙවිය යුතු රු. 175,000.00 සහ එහි ජල බවුසරය සවි කිරීම වෙනුවෙන් විමල් ඉංජිනියර්ස් පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු රු. 675,000.00ක සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 සවි කරන ලද ජල බවුසරය සඳහා රු. 675,000.00ක් ගෙවීම**

ලිපි අංක 06:15 යටතේ තීරණයක් ගන්නා ලදී.

**06:16 බෝම්බුව හා වැවේවත්ත ප්‍රජා ශාලාවේ පවත්වාගෙන යනු ලබන කාර්යාල සඳහා බදු කුලී අය කිරීම**

බෝම්බුව හා වැවේවත්ත ප්‍රජා ශාලාවේ පවත්වාගෙන යනු ලබන ග්‍රාම නිලධාරී, සමෘද්ධි නිලධාරී කාර්යාලයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ගෙවනු ලබන දීමනාව මාසික බදු කුලිය වශයෙන් අය කර ගැනීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීම**

2014 අප්‍රේල් මස 13, 14, 15, 16 හා 17 දිනයන්හි පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීමේ සේවයෙන් බැහැරව සිටින බව එම්. ජී. පියසේන යන අය විසින් දන්වා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම්දුන් අතර, 12, 14 හා 15 දිනයන් ගාස්තුවෙන් නිදහස් කිරීමටත් ඉතිරි දින දෙක සඳහා සභාවෙන් සේවකයකු යොදවා අය කිරීමටත් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 කල් ඉකුත් වී ඇති පැරණි ලිපිගොණු හා ලේඛන අපහරණය කිරීම**

මෙම නගර සභා කාර්යාලයේ ලේඛනාගාරයෙහි වසර 05කට වඩා පැරණි කල් ඉකුත් වී ඇති ලිපිගොණු සහ ලේඛන අපහරණය කිරීමට සහ එය අධීක්ෂණය කිරීම සඳහා තමන් සමඟ ගරු උප සභාපතිතුමන් සහ නගර සභා ගරු මන්ත්‍රී මලික් ෂා මැතිතුමන් නම් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 සේනක පෙදෙස අංක 25 දරන නිවස ආශ්‍රිත අතුරු මාර්ගය - ආරක්ෂිත පැතිබැම්ම සම්බන්ධව - එස්. එච්. නිමල් රංජිත් ප්‍රියන්ත මයා**

සේනක පෙදෙස අංක 25 දරන නිවස ආශ්‍රිත අතුරු මාර්ගයේ පැතිබැම්ම සකස් කිරීමට වත්කමක් නොමැති බැවින් සහ එය අනාරක්ෂිතව පවතින බැවින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් එස්. එච්. නිමල් රංජිත් ප්‍රියන්ත යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම පැතිබැම්ම සභාව මගින් ඉදිකිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

සභා යෝජනා අංක **12:01** යටතේ සම්මත කරනු ලබන මුදල් කාරක සභා වාර්තාවට රු. 10,000.00ට වැඩි ගෙවීම් ඇතුළත් වේ.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

මෙවර මහා සභාවට ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර මහා සභාවට ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබිණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

11:01:01 ජල ටැංකිය අසළ ඌරු ගොවිපල විධිමත් නොවීම නිසා ඇතිවන ගැටලු සඳහා සාකච්ඡා කිරීම හා යෝජනා කිරීම

11:01:02 වැවවත්ත දමිල ජනතාවගේ පාරිසරික ගැටලු යෝජනා කිරීම

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11:02 නගර සභා ගරු මන්ත්‍රී ඒ. ඒ. එන්. විජයසිංහ මැතිතුමා

11:01:01 ටකරං මඩු වල අඩුපාඩුකම් සපුරා අදාල සමිති වෙත ලබා දීම

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11:03 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

11:01:01 නගරයේ ගිනි ආරක්ෂණ කපොලු යලි විවෘත කිරීම

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාවන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 සෞඛ්‍ය, ඝන අපද්‍රව්‍ය හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව

2014.03.07 වන දින පැවති සෞඛ්‍ය, ඝන අපද්‍රව්‍ය හා ආපදා කළමනාකරණ කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 පුස්තකාල උපදේශන සභා වාර්තාව**

2014.03.11 වන දින පැවති පුස්තකාල උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:03 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව**

2014.03.21 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:03 මුදල් කාරක සභා වාර්තාව**

2014.03.21 වන දින පැවති මුදල් කාරක සභා වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

13:01 2014 පෙබරවාරි මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 6,833,014.28 |
| වෙනත් ලැබීම් | 2,187,173.12 |
| **මුළු ලැබීම්** | **9,020,187.40** |

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | 6,049,555.73 |
| වෙනත් වියදම් | 7,473,669.52 |
| **මුළු වියදම්** | **13,523,225.25** |

- බලන්ගොඩ තානායමේ 2014.02.01 වන දින සිට 2014.02.28 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 2014.02.01 සිට 2014.02.28 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2014.02.01 සිට 2014.02.28 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 649,528.20 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු

**14:01 නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

මෙම නගර සභාව මගින් සංවර්ධනය කරන ලද කල්තොට පාර මාර්ගයන් හි ගරු සභාපතිතුමන්ගේ නම සහිතව ගරු මන්ත්‍රීතුමන්ලාගේ උපදෙස් පරිදි යැයි සඳහන් කර ඇති බවත්, එය නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා පරිදි යනුවෙන් නිවැරදි විය යුතු බවත් නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

**14:02 නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

මාස කිහිපයකට පසු මෙදින මහා සභා රැස්වීමේ දී හොඳ ප්‍රවණතාවයක් දක්නට ලැබුණු බවත් කලක් ගතවීමෙන් පසු හෝ නගර සභා ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම සමානව සැලකීමට ගරු සභාපතිතුමන් විසින් තීරණය කිරීම වැදගත් බවත්, සභාපතිතුමන් දෙපසින් සහ පසුපසින් සිටිමින් ප්‍රතිපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ප්‍රතිපාදන ලබා නොදෙන ලෙස කියන කිහිප දෙනෙකු සිටින බවත් නගර සභා ගරු මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී. නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් තම කණ්ඩායම සහ ගරු සභාපතිතුමන් අතර වෛරය සහ කෝපය ඇතිවන අයුරින් අදහස් දක්වන අතර එසේ නොකරන ලෙස ඉල්ලන බවත්, එම අවස්ථාවන්හි තමන් ද කැළඹීට ලක් වුවත් ලබා ඇති ආභාෂය අනුව එය සමනය කරගන්නා බවත් එතුමන් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලද අතර, කෙටි කාලයකට ගරු සභාපතිතුමන්ගේ කටයුතු වලට පසුබෑමකින් යුතුව සම්බන්ධ වුවත්, සභාවේ කටයුතු වලට මෙතැන් සිට ඉදිරියට උදව් උපකාර කිරීමට බලාපොරොත්තු වන බවත් පවසන ලදී.

පසුගිය දෙසැම්බර් මස 28 හා 29 දිනයන්හි උඩඇල්ලෙපොල විශුද්ධාරාමයේ කටයුතු වලට ගරු සභාපතිතුමන් අවශ්‍ය දායකත්වය ලබා දුන් බවත්, සියලු නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ දායකත්වය මත ජල බවුසරය, ජේ සී බී යන්ත්‍රය ඇතුළු පහසුකම් සපයා දුන් බවත්, මෙවර අප්‍රේල් මාසයේ දී ගම් වාසීන් සියලු දෙනාගේ මූලිකත්වයෙන් අවුරුදු උත්සවයක් සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් එතුමන් ප්‍රකාශ කරන ලද අතර, ඒ සඳහා සහභාගී වන මෙන් සියලු දෙනාට ආරාධනා කරන ලදී.

**14:03 නගර සභා ගරු මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

බළන්ගොඩ, පුරණගෙදර ගම්මානයේ කෙළවර ප්‍රදේශයේ ජල හිඟ කමක් පවතින බවත්, ගමේ පවුල් 25-30 අතර ප්‍රමාණයක් දුර පිහිටි ලිං වලින් ජලය සපයා ගන්නා බවත්, මෙම වර්ෂයේ තම අයවැය ප්‍රතිපාදන වලින් එම ප්‍රදේශයට ජලය ලබා දීමට අනුමැතිය ඉල්ලන බවත්, ඒ සඳහා රුපියල් ලක්ෂ එක හමාරක් පමණ වැය වනු ඇති බවත් නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම, ඕලුගංතොට බළන්ගොඩ පුවරුව අසල පැවති බස් නැවතුම තේ ශක්ති කර්මාන්ත ශාලාව අසළට රැගෙන ගොස් ඇති බව ද, පාසැල් සිසුන් ඇතුළු වැඩි දෙනෙකුට පුවරුව අසළට පැමිණීම පහසු බව ද සඳහන් කළ නගර සභා ගරු මන්ත්‍රීතුමන් නැවත එම ස්ථානයේ බස් නැවතුම පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දෙන මෙන් ඉල්ලන ලදී.

**14:04 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය ජයග්‍රහණය කළ බැවින් තමන් මෙම සභාවේ සිටින බවත්, එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළේ නම් තමන් හට හෝ නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන්ට මෙම සභාව නියෝජනය කිරීමට නොහැකි වනු ඇති බවත්, නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් සඳහන් කළ අතර, මෙම සභාවේ සිටින එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාට පෞද්ගලිකව විරුද්ධව නොව එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට විරුද්ධව තමන් කතා කරන බවත්, තමන්ගේ අදහස ආණ්ඩු පක්ෂය ශක්තිමත් කිරීමට බවත්, විරුද්ධ පක්ෂය ශක්තිමත් වීම තුළින් ආණ්ඩු පක්ෂය පහලට බසින බවත්, තම ප්‍රතිපත්තියට අනුව විපක්ෂය නියෝජනය කරන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාට අයවැය ප්‍රතිපාදන ලබා දීමට විරුද්ධ වන බවත් ප්‍රකාශ කරන ලදී. තමන් කතා කරන්නේ ආණ්ඩු පක්ෂයේ පසුපෙළ මන්ත්‍රීවරයකු වශයෙන් බවත් මුදල් ලබා දෙනවා ද නැද්ද යන්න තීරණය කිරීම ගරු සභාපතිතුමන්ට භාර බවත් එතුමා පවසන ලදී.

මාර්ග සංවර්ධනය සම්බන්ධව ගරු උප සභාපතිතුමන් චෝදනා කළත්, බළන්ගොඩ නගර සභාව මගින් විශාල සංවර්ධනයක් සිදුකෙරෙන බවත්, එය සිදුකිරීමට ගතවන කාලයත්, වැයවන මුදලත්, යෙදවිය හැකි කම්කරු ප්‍රමාණයත් අනුව එහි සීඝ්‍රතාවය තීරණය වන බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී. අලුත්වැඩියා කිරීමට පෙර තිබුණාටත් වඩා මේ වන විට ෆලීල් හජ්ජියාර් මාවත අබලන් තත්ත්වයට පත් වී ඇති බව නගර සභා ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලද අතර, ඒ සම්බන්ධව විශේෂ අධීක්ෂණයක් කරන මෙන් කාර්මික නිලධාරී මහතා හට දන්වන බවත් පවසන ලදී.

ලංකා ඉතිහාසයේ පෙර කවර කලකටත් වඩා අයවැය මගින් පළාත් පාලන ගරු මන්ත්‍රීතුමන්ලා හට ප්‍රතිපාදන වෙන් කර විශාල සංවර්ධනයක් සිදු කිරීමට අවස්ථාව ලබා දී ඇති බවත්, ජන සභා ඔස්සේ එම අදහස් ලබාගෙන කටයුතු කෙරෙන බවත් නගර සභා ගරු මන්ත්‍රීතුන් ප්‍රකාශ කරන ලදී.

පාසැල් සංවර්ධනය මෙන්ම කෘෂිකාර්මික සංවර්ධනය ද සිදු කෙරෙන බව ඒ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන්ට සහ ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමන්ට ස්තුතිය පළ කරන බවත් නගර සභා ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදී. අතිගරු ජනාධිපතිතුමන් දිවයිනේ ඕනෑම ස්ථානයක ඇවිදීමට නිදහස ලබා දී ඇති බවත්, බලාපොරොත්තු නොවූ විශාල සංවර්ධනයක් ලැබී ඇති බවත්, රටට එරෙහිව ජිනීවා හි දී ගනු ලබන තීන්දුවට විරෝධය පළ කරන බවත් ඔවුන් එදා මෙරට යටත් කරගෙන සිටියා

මෙන් දැන් ද යටත් කර ගැනීමට උත්සාහ කරන බවත් එතුමන් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

වියලි කාලගුණ තත්ත්වය යටතේ බළන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට නගර සභාව මැදිහත් වී ජලය ලබා දීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් ඇතුළු සියලු දෙනාට ස්තුතිය පළ කරන බවත් එතුමන් පවසන ලදී.

**14:05 නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

මාස ගණනක් තිස්සේ පවතින දැඩි නියඟය හේතුවෙන් ශෛලතලාරාම, මුගුණමලය, ඉත්තැගල හේන, දොරවෙල, උඩකන්ද, බැංකියවත්ත සහ වැලිහරණාව ප්‍රදේශයන්හි ජනතාව දැඩි අපහසුතාවයට පත්ව සිටින බැවින් දින දෙකකට වරක්වත් ජලය ලබා දෙන මෙන් ද, මෙතෙක් ජලය ලබා නොදුන් ප්‍රදේශ වලට ජලය ලබා දෙන මෙන් ද නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඉල්ලන ලදී. ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් සමඟ සාකච්ඡා කර බැංකියවත්ත, උඩකන්ද, කිරිඳිගල සහ ශෛලතලාරාම ප්‍රදේශයන්ට මුදල් වෙන් කර ගැනීමට කටයුතු කරන මෙන් ද එතුමන් ඉල්ලා සිටින ලදී.

ආණ්ඩු පක්ෂ සහ විපක්ෂ කණ්ඩායම් අතර ගැටුම් සමථයකට පත් වීම සම්බන්ධයෙන් සිය ප්‍රසාදය ද එතුමන් විසින් පළ කරන ලදී.

**14:06 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ජනතාවට විනෝදවීම සඳහා නගරයේ ස්ථානයක් නොමැති බව ද, සමාජයේ බොහෝ දෙනෙක් දැඩි පීඩනයෙන් සිටින බැවින් චිත්‍රපට ශාලා නැවත විවෘත කරන මෙන් චිත්‍රපට සංස්ථාවෙන් ඉල්ලීම කළ යුතු බව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් ප්‍රකාශ කරන ලදී.

නව ස්ථිර පත්වීම් ලබා ගත් සේවකයන් හට අදාල ලිපි ප්‍රදානයේ දී විපක්ෂයේ නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාට ද අවස්ථාව ලබා දීම ප්‍රශංසනීය බවත්, ගරු සභාපතිතුමන්ගේ නම්‍යශීලී නායකත්වය අගය කරන බවත් එතුමන් පවසන ලදී. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කරවීම සත්‍යයක් වුවත් අනෙක් පක්ෂ නියෝජනය කරන නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාට ද ප්‍රතිපාදන ලබා දීම කළ යුතු බවත්, මින් පෙර එසේ ලබා නොදුන්න ද, එක්සත් ජනතා නිදහස් සන්ධාන පාලනය යටතේ ලබා දීමට කටයුතු කර ඇති බවත් එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. කඩුවෙල මහා නගර සසභාවේ එක් නාගරික මන්ත්‍රීවරයකුට රුපියල් ලක්ෂ දහය බැගින් වාර්ෂික ප්‍රතිපාදන වෙන් වන බව නගර සභා ගරු මන්ත්‍රීතුමන් සඳහන් කළ අතර, මෙම නගර සභාව ද එවන් මට්ටමකට ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

වියදම් ලේඛන සඳහා විරුද්ධ වන්නේ එයින් ජනතාවට සේවයක් සැලසෙන බැවින් බව ද, වර්ෂ 2006 සිට මෙම සභාවේ රැඳී සිටිමින් සිදු කරන ලද විප්ලවයන් තුළින් යහපතක් සිදුවූ බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:07 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

සියලු දෙනා අදහස් විවෘතව කතා කිරීම වැදගත් බවත්, එයින් පුද්ගලයින්ගේ ස්වභාවය වටහා ගැනීම පහසු වන බවත්, මෙම සභාවේ සිදුවන දෑ පිළිබඳව ජනතාව විමසිල්ලෙන් සිටින බවත්, තමන් මෙහි සිටින සියලු දෙනාටම සහෝදරයන් මෙන් සලකන බවත් ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

ජපානයේ සෙන්දායි නගරයේ පැවැත්වූ වැඩසටහනට තමන් සහභාගී වූ බවත්, ගරු සභාපතිතුමන් වෙනුවට උප සභාපතිවරයා වශයෙන් තමන්ට එහි නොමිලේ යාමට අවස්ථාව නොලැබීම සම්බන්ධයෙන් කණගාටු වන බවත්, තම පෞද්ගලික මුදලින් රුපියල් ලක්ෂ තුනක් පමණ වියදම් කර ඒ සඳහා සහභාගී වූ බවත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා සෙන්දායි නගරයට ගුවන් යානයෙන් ගමන් කරද්දී උප සභාපතිවරයා වශයෙන් තමන් එහි

කි. මී. 800ක ප්‍රමාණයක් බස් රථයෙන් ගමන් කළ බව ද, අතිවිශාල ජනගහණයක් ඇති එම නගරයේ දී තමන් අසරණ වූ බවත්, එතරම් විශාල නගරයක අදාල වැඩසටහන පැවැත්වෙන ස්ථානය සොයා ගැනීමට හැකිවේ දැයි සිතුණු බවත්, ඒ සඳහා සහභාගී වූ රටවල් හතර අතරින් දේශපාලන නායකයකු වශයෙන් සහභාගී වූයේ තමන් පමණක් බවත්, තමන් හට එහි විශේෂ ආසනයක් වෙන් කර තිබූ බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී. එහි දී නවාතැන් පහසුකම් ලබා ගැනීමට මෙන්ම යාම් ඊම් සඳහා ද විශාල මුදලක් තමන් හට වියදම් වූ බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් රු. 35,910ක මුදල් ප්‍රමාණයක් ඒ මහතාට පසුගිය දකුණු කොරියා සංචාරයෙන් ලැබිය යුතු මුදලින් ලබා දුන් බවත් ගරු උප සභාපතිතුමන් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

මෙම සභාවේ දී තමන් ගරු සභාපතිතුමන් ආරක්ෂා කළ යුතු විට එසේ කරන බවත්, විවේචනය කළ යුතු විට ද විවේචනය කරන බවත්, එතුමන් හරි මගට ගැනීමට ඕනෑම දෙයක් සිදු කරන බවත්, විපක්ෂයේ නගර සභා ගරු මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව තමන් ද මුල දී විරුද්ධ වූ බවත්, හිටපු ගරු සභාපති විමලසේන වැවේගෙදර මැතිතුමන්ගේ පාලන සමයේ දී එක්සත් ජාතික පක්ෂය නගර සභාව අයත් වුවත්, ජනාධිපතිධූරය සහ පළාත් සභාව පැවතියේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට බැවින් සභාවට ලැබුණු මුදල් ප්‍රතිපාදන අවම බැවින් එසේ විපක්ෂ මන්ත්‍රීවරුන්ට මුදල් ප්‍රතිපාදන ලබා දීමට නොහැකි වන්නට ඇති බව ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. ජනතාවට සේවය කිරීම සඳහා එක්සත් ජාතික පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාට ද ප්‍රතිපාදන ලබා දිය යුතු යැයි තමන් අදහස් කරන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමන් අභිභවා තමන් කටයුතු නොකරන බව ද ගරු උප සභාපතිතුමන් වැඩි දුරටත් පවසන ලදී. තම ජීවිතයේ සියල්ල ලබා ගත්තේ සටන් කිරීමෙන් පසු බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

ජපන් සංචාරය සම්බනධයෙන් ගරු සභාපතිතුමන් විමසූ විට ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කළේ:

තමන් සහභාගී වූ වැඩසටහන පැවති සෙන්දායි නගරය පසුගිය කාලයේ ඇති වූ සුනාමි ව්‍යසනයෙන් දැඩි හානියට ලක් වූ අතර, එහි න්‍යෂ්ඨික බලාගාරය පවා හානී වී තිබූ බවත් ඉතාමත් දියුණු තාක්ෂණයක් සහිත ජපානය දැඩි හිම පතන, භූමිකම්පා, සුනාමි ආදී ස්වභාවික ආපදාවන්ට ලක්වෙමින් තිබිය දීත් විශාල දියුණුවක් ලබා තිබෙන බවත් ය. එහි දී මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතා හොඳ ඉදිරිපත් කිරීමක් සිදු කළ බව ද එතුමන් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

## 15. අවසානය

### ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා

ඉත්තෑගල හේන ප්‍රදේශයේ උණ සන්නිපාත රෝගීන් කිහිප දෙනෙකු වාර්තා වී ඇති බව දන්වමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක බී. එල්. කේ. එල්. කුමාරසිංහ මහතා විසින් ලිපියක් මෙම සභාවට ඉදිරිපත් කර ඇති බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී. මෙම තත්ත්වයට හේතුව නිසි වැසිකිලි පහසුකම් නොමැති වීම බැවින් කඩිනම් ක්‍රියාමාර්ගයක් වශයෙන් සභා අරමුදලින් පිරිමි සහ කාන්තා වැසිකිලිය බැගින් හෝ සාදා දීමට ගරු සභාපතිතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි ගරු සභාපතිතුමන් විසින් විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

සියලු දෙනාටම ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සුභ අලුත් අවුරුද්දක් වේවා යි ප්‍රාර්ථනා කරමින් ගරු සභාපතිතුමන් විසින් මහා සභාව ප. ව. 2.00ට අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.